**ශීර්ෂය - 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2016 වර්ෂය**
----------------------------------------------------------------------------------------------------

ශීර්ෂය 288 - මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජුනි 29 දින සර්වේයර් ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගණුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**
----------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**
--------

**2.1 විසර්ජන ගිණුම්**
------------------

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**
------------------------------

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 3,607.85 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 3,528.86 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 78.99 ක් හෙවත් සියයට 2.19 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
| --- | --- | --- | --- | --- |
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 3,360.19 | 3,326.86 | 33.33 | 0.99 |
| මූලධන | 247.66 | 202.00 | 45.66 | 18.44 |
| **එකතුව** | **3,607.85** | **3,528.86** | **78.99** | **2.19** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

බිම්සවිය වැඩසටහන සඳහා දෙපාර්තමේන්තුව වෙත ඉඩම් අමාත්‍යාංශය විසින් එකතුව රු.මිලියන 250 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිට ඉන් රු.මිලියන 249 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 1 ක් හෙවත් සියයට 0.4 ක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි.

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේත අංක 20-03-02-04 සඳහා එකතුව රු.මිලියන 320.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 465.02 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 145.31 ක් වී තිබුණි.

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබූ සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 28801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 148.00 | 143.96 | 105.00 | 123.32 | 400.00 | 334.26 |

**2.4 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0044/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 25.18 ක් විය.

**2.5 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු. මිලියන 17.22 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු.මිලියන |
| 6000/0000/00/0002/0117/000 | 3.26 |
| 6000/0000/00/0013/0077/000 | 3.11 |
| 6000/0000/00/0016/0065/000 | 10.85 |
| **එකතුව** | **17.22** |

**2.6 විගණන නිරීක්ෂණය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා ගෙනයාම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය/මුදල් රෙගුලාසි 502(2) | පවත්වා නොතිබුණි. |
| (ආ) | පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පවත්වා නොතිබුණි. |
| (ඇ) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) | පවත්වා නොතිබුණි. |
| (ඈ) | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. |
| (ඉ) | බඩු ලේඛන පොත් | මුදල් රෙගුලාසි 754 හා මුදල් රෙගුලාසි 751(1) | යාවත්කාලීන කර නොතිබුණි. |

### 3.2 විසර්ජන ගිණුම

#### 3.2.1 අනිවාර්ය ඉතිරිකිරීම්

2015 දෙසැම්බර් 29 දිනැති අංක 07/2015 දරන අයවැය චක්‍රලේඛයේ දෙවන ඡේදය ප්‍රකාරව අනිවාර්යය ඉතිරි කිරීම් සිදු කළ යුතු වැය විෂයයන් 02 ක රු.7,869,136 ක් අදාල චක්‍රලේඛ නියෝගයෙන් බැහැරව වැයකර තිබුණි.

#### 3.2.2 අධි ප්‍රතිපාදන සලසා ගැනීම

වැය විෂයයන් 35 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසුව එකතුව රු.65,805,109 ක ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 සිට සියයට 57 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### 3.2.3 පරිපූරක ඇස්තමේන්තු යටතේ ප්‍රතිපාදිත මුදල්

පරිපූරක වෙන්කිරීම් යටතේ පුනරාවර්තන වැය විෂයයකට රු.27,001,461 ක මුදලක් ලබා දී තිබුණු නමුත්, එම වැය විෂයය යටතේ ප්‍රතිපාදිත මුදල් රු.125,000,000 ක් මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයයකට මාරුකර තිබුණි.

### 3.2.4 බැරකම් හෙළිදරව් කිරීම

රු. 212,655 ක බැරකම් විසර්ජන ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි.

### 3.2.5 පාඩු හා අත්හැරීම්

පාඩු සහ අත්හැරීම් ලෙස හෙළිදරව් කර ඇති රු.4,274,993 ක ණය ශේෂ පොත්වලින් අස් කිරීමට හෝ අත්හැර දැමීමට නිසි අධිකාරී බලය ලබාගෙන නොතිබුණි.

## 3.3 ආදායම් ගිණුම

20-03-02-04 දරන මැනුම්පති ආදායම් සංකේතය යටතේ කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(අ) රු.මිලියන 320 ක ආදායමක් රැස් කිරීමට ඇස්තමේන්තු කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 465 ක ආදායමක් රැස්කර තිබුණි.

(ආ) එකතුව රු.25,160 ක ආදායමක් වර්ෂ හතරක සිට හිඟහිට තිබුණි.

(ඇ) මැනුම්පති ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව ප්‍රවර්තන වර්ෂයේ සියයට 15 කින් අඩු වී තිබුණි.

## 3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

සමාලෝචිත වර්ෂයට අදාල විෂය අංක 28801 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පරීක්ෂාවේදී හෙළිදරවු වූ කරුණු පහත දැක්වේ.

(අ) අයවීම හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.7,967,185 ක් වූ අතර, ඒවා වර්ෂ 01 සිට වර්ෂ 34 දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණි. එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දූර්වල තත්ත්වයක පැවතුණි.

(ආ) දෙපාර්තමේන්තුව ණය පාලන ගිණුමක් පවත්වා නොතිබුණි. එසේම සෑම මාසයක් අවසානයේදීම සීසී 10 ලේඛනයේ ශේෂයන් හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත ශේෂයන් සමඟ පාලන ගිණුමේ ශේෂයන් සන්සන්දනය කර නොතිබුණි.

(ඇ) දෙපාර්තමේන්තු වාර්තා අනුව ණය අත්තිකාරම් ගෙවීම් භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත සටහන් සමඟ සැසඳීමේ දී රු.104,809 ක වෙනසක් පැවතුණි.

(ඈ) ණය ලැබීම්වල තථ්‍ය අගයයන් දෙපාර්තමේන්තු වාර්තා සහ භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව රු.343,764 ක වෙනසක් පැවතුණි.

(ඉ) භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව හර ශේෂයේ උපරිම සීමාවේ තථ්‍ය අගය හා පළාත් කාර්යාලවල සාරාංශ වාර්තා අතර තථ්‍ය අගය රු.93,403 ක වෙනසක් පැවතුණි.

(ඊ) දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර ස්ථාන මාරු වී ගිය සහ පැමිණි නිළධාරීන්ගේ ණය ශේෂ අතර රු.1,576,792 ක වෙනසක් පැවතුණි.

(උ) ප්‍රධාන කාර්යාලයේ හා බස්නාහිර පළාත් කාර්යාලයේ ණය ලිපිගොනු නියැදියක් පරීක්ෂා කිරීමේ දී නිළධාරීන් දස දෙනෙකුට ලබාදුන් රු.946,150 ක ආපදා ණයවලට අදාල වාරික හා පොලී සීසී 10 ලේඛනයට ඇතුළත් නොකිරීම, ඇතුළත් කිරීමේ ප්‍රමාදයන්, වැරදියට ඇතුළත් කිරීම හා වාරික අයකිරීමේ ප්‍රමාදයන් පැවතුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

---------------------------

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

### (අ) නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

--------------------------------------

නිශ්ක්‍රීය හෝ ඌන උපයෝජිත වත්කම් පිළිබඳව විස්තර පහත දැක්වේ.

| වත්කම් වර්ගය | ඒකක ගණන | නිශ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවැති කාලය |
|---|---|---|
| **ගොඩනැගිලි :** | | |
| • දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ නිළ නිවාස | 23 | වර්ෂ 01 සිට 03 දක්වා |
| • ඌව පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ තාක්ෂණික නිළධාරී නිළ නිවස | 01 | වර්ෂ 03 |
| • බදුල්ල ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී නිළ නිවස | 01 | වර්ෂ 01 |

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

(i) ඉඩම් අමාත්‍යාංශයේ වාහන 16 ක් 2014 වර්ෂයේ සිට විධිමත්ව පවරා ගැනීමකින් තොරව දෙපාර්තමේන්තුව පරිහරණය කරමින් පවතී.

(ii) බිම්සවිය ප්‍රතිපාදන මගින් රු.මිලියන 312 ක් වැයකර මිලදී ගන්නා ලද මැනුම් උපකරණ ඇතුළු විවිධ ප්‍රාග්ධන වත්කම් හා රු.මිලියන 82 ක් වැයකර ඉදිකරන ලද ගොඩනැගිලි, ඉඩම් අමාත්‍යාංශයෙන් පවරාගැනීමකින් තොරව පරිහරණය කරමින් තිබුණි.

**(ඇ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2016 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල වටිනාකම රු.27,301,262 ක් විය.

**3.6 අනුකූල නොවීම**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම (රු.) | අනුකූල නොවීම |
|---|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 104 (3) | 754,128 | සමාලෝචිත වර්ෂයේදී වාහන 11 කට සිදුවූ අලාභහානි සම්බන්ධයෙන් ප්‍රාරම්භක වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 104 (4) | 315,264 | සමාලෝචිත වර්ෂයේදී වාහන 04 කට සිදුවූ අලාභහානි සම්බන්ධයෙන් තුන් මසක් ඇතුලත පරිපූර්ණ වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. |

## 3.7 කාර්යසාධනය

2016 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### (අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්

දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුනොකර තිබුණු අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) 2009 වර්ෂයේ සිට 2016 දෙසැම්බර් 31 දින දක්වා ඉතිරිව ඇති මැනුම් නියෝග සංඛ්‍යාව 18511 ක් වූ අතර, පසුගිය වර්ෂ හත තුළ ඉතිරිව පැවති මැනුම් නියෝග සංඛ්‍යාව ක්‍රමිකව වර්ධනය වී තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ දී නිම කිරීමට තිබූ මුළු මැනුම් නියෝග සංඛ්‍යාව 32924 ක් වූ අතර, මෙයින් නිමකර තිබුනේ මැනුම් නියෝග 18413 ක් හෙවත් මුළු මැනුම් නියෝගවලින් සියයට 49 කි.

(iii) වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය කරන ලද මැනුම් ඉල්ලීම්වලින් ප්‍රවර්තන වර්ෂය අවසානයට ඉටුකර තිබුණේ සියයට 18 ක ප්‍රමාණයක් පමණි.

(iv) 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා බිම්සවිය වැඩ සටහනේ සමස්ථ ප්‍රගතිය සියයට 10 කි. නමුත් දිරිදීමනා වශයෙන් රු.මිලියන 245 ක් ගෙවා තිබුණි.

### (ආ) සැලසුම් කිරීම

මිනින්දෝරුවරයකුට මසකට මැනිය යුතු අවම බිම් කැබලි සංඛ්‍යාව වන (Norms) 20 ක් වූ සම්මතය වර්තමානයේ දියුණු තාක්ෂණික උපකරණ භාවිතයත් සමඟ ඉහල නොදමා, ඒ මත සැලසුම් කිරීම හේතුවෙන් භෞතික කාර්ය සාධනය සියයට 200 ක වර්ධනයක් පෙන්නුම් කර තිබුණි.

## 3.8 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**3.8.1 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

**(අ) ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීම**

(i) ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත්ව තිබූ රු.මිලියන 15.22 ක් වටිනා මිළදී ගැනීම් වර්ෂය තුළ සිදුකර නොතිබුණු අතර, ප්‍රසම්පාදන සැලැස්මට ඇතුළත් නොවූ රු.මිලියන 8.68 ක් වටිනා මිළදී ගැනීම් සිදුකර තිබුණි.

(ii) ප්‍රසම්පාදන සැලැස්මෙහි භාණ්ඩ හා උපකරණ වර්ග 05 ක් සඳහා රු.මිලියන 9.80 ක් හා ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා රු.මිලියන 19.54 ක අධි ඇස්තමේන්තුවක් සහිතව සකස්කර තිබුණි.

(iii) ප්‍රසම්පාදන සැලැස්මෙහි භාණ්ඩ හා උපකරණ වර්ග 09 ක් සඳහා රු.මිලියන 5.68 ක ඌන ඇස්තමේන්තුවක් සහිතව සකස්කර තිබුණි.

**(ආ) සංචාරක නිවාස හා මිනින්දෝරු කාර්යාල ඉදිකිරීම**

රු.මිලියන 60.19 ක වියදමකින් ත්‍රිකුණාමලය, වවුනියාව සහ කැකිරාව යන මිනින්දෝරු කාර්යාල හා කුච්චවේලි සංචාරක නිවාසය සහ එහි ජල ටැංකිය ඉදිකිරිමේ කොන්ත්‍රාත්තු යටතේ නිරීක්ෂණය වූ ප්‍රධාන කරුණු පහත දැක්වේ.

(i) මෙම ඉදිකිරීම්වලදී නිමකර තිබූ වැඩ ප්‍රමාණය ඉක්මවා ගෙවීම්, නිම නොකල වැඩ සඳහා ගෙවීම්, ඇස්තමේන්තු මුදල ඉක්මවා ගෙවීම් සහ ඇස්තමේන්තුවල සඳහන් නොවූ අයිතමයන් සඳහා රු.මිලියන 8.24 ක් ගෙවා තිබුණි.

(ii) මුළු පිරිවැය ඇස්තමේන්තු සකස් කිරීමේදී සම්මත ඉදිකිරීම් රේටයන් වල (BSR) මිල ගණන්වලට අනුකූලව සකස්කර නොතිබුණි. තවද ඉදිරිපත් වූ මිල ගණන් වල විචලනයේ ප්‍රමාණයන් ලෙස දක්වන ලේඛන සකස් නොකිරීම, ඇස්තමේන්තුවල සමහර අයිතමයන් අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා ඇතුළත් කිරීම, දඩ මුදල් සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවට අවාසිදායක ලෙස දඩ මුදල් ගණනය කිරීම වශයෙන් මූලික අඩුපාඩු ගණනාවක් නිරීක්ෂණය විය.

(iii) කොන්ත්‍රාත්කරුවන්ගේ පූර්ව සුදුසුකම් විධිමත්ව පරීක්ෂාකර ඉදිරිපත් වූ කොන්ත්‍රාත් මිළ ගණන් සම්බන්ධයෙන් නිසි ඇගයීමක් කර නොතිබුණි.

ඉදිරිපත් වූ අවම මිළ ගණන් සහ තෝරාගත් මිළ ගණන් අතර රු.මිලියන 3.47 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

(iv) 2016 ඔක්තෝබර් 12 දින වවුනියා දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු භෞතිකව පරික්ෂා කිරීමේදී දොර ජනෙල්, බිම කොන්ක්‍රීට් කිරීම, ජල නල හා අපවහන පද්ධති එලීම හා වහළය නිම කිරීම වැනි වැඩ කිසිවක් නිමකර නොතිබූ බව නිරීක්ෂණය විය. තවද එදිනට නිමකල වැඩ කොටස් ලෙස සඳහන් කරමින් රු.මිලියන 3.06 ක මුදලක් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවා තිබුණි.

(v) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය හා කුච්චවේලි සංචාරක නිවාසයේ ස්වයංක්‍රීය දොර වැසුම් 74 ක් සවි නොකර රු. 444,000 ක් වැඩිපුර ගෙවා තිබුණි. මළ අපවහන නල අවශ්‍ය ප්‍රමිතියෙන් තොරව නිම කිරීම, යෙදිය යුතු ගඩොල් වෙනුවට ප්‍රමිතියෙන් අඩු ගඩොල් යෙදීම, ජනෙල් සහ පාර්ටිශන් සඳහා ප්‍රමිතියෙන් අඩු වීදුරු යෙදීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය. ඊට අමතරව සංචාරක නිවාසයේ ප්‍රමාණ පත්‍රවල සඳහන් කම්බිවල ඝනකමට වඩා වැඩි කම්බි යොදා අදාල ගොඩනැගිල්ල නිම කර තිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ) දියතලාව මැනුම් සිතියම්ගත කිරීමේ කාර්යාලයේ අළුත්වැඩියාව**

සමාලෝචිත වර්ෂය තුලදී දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයට අයත් මාර්ගයක හා ගරාජයක අලුත්වැඩියාව වෙනුවෙන් රු.985,005 ක් වැය කර තිබුණි. කෙසේ වුවද එම කොන්ත්‍රාත්තු අදාල ඇස්තමේන්තුවලට අනුකූලව නිසි තාක්ෂණික උපදෙස් මත සිදු නොකිරීම හේතුවෙන් අසාර්ථක වී තිබුණි.

**(ඈ) පූර්ණමාන හා අදාළ උපකරණ මිලදී ගැනීම**

සමාලෝචිත වර්ෂයේදී කාර්යසාධනය ඉහල නැංවීමේ අරමුණ වෙනුවෙන් රු.මිලියන 46.39 ක වියදමින් පූර්ණමාන 25 ක්, Hand Held GPS 189 ක් සහ පරිගණක 165 ක් මිළට ගෙන තිබුණි. ඉතාලියේ නිෂ්පාදිත තත්ත්වයෙන් උසස් පූර්ණමාන බවට තාක්ෂණික ඇගයීම් කමිටුවේ වැරදි නිර්දේශයක් මත එම උපකරණ මිළදී ගෙන තිබුණි. මේ නිසා වර්ෂයකටත් අඩු කාලපරිච්ඡේදයක් තුළ විවිධ තාක්ෂණික දෝෂ හටගෙන තිබුණි. තවද පිරිවිතරයේ සඳහන් පරිදි ලැප්ටොප් පරිගණක මිළදී ගැනීමට කටයුතු කර නොතිබුණි. අදාල අනෙකුත් නිරීක්ෂණ පහත දැක්වේ.

(i) Hand Held GPS මිලදී ගැනීමේ දී ප්‍රමාණවත් මුද්‍රා තැබූ මිළ ගණන් කැඳවීමකින් තොරව ප්‍රසම්පාදන තීරණ ගෙන තිබුණි.

(ii) ලැප්ටොප් හා ඩෙස්ක්ටොප් පරිගණක සඳහා අඩුම මිළ ගණන් ඉදිරිපත් කළ ලංසුකරුවන් තෝරා ගැනීමෙන් පසු එම ලංසුකරුවන් ප්‍රතිචාර දැක්වීමෙන් වැළකී තිබුණි. මෙම ලංසුකරුවන්ගේ රු.152,000 ක ලංසු සුරක්ෂණ රාජසන්තක කිරීමට කටයුතු කර නොතිබුණි.

**(ඉ) CORS පද්ධතිය ස්ථාපිත කිරීම**

----------------------------------

මුළු දිවයිනම ආවරණය වන පරිදි CORS නැමැති පද්ධති 40 ක් අවශ්‍යව තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 30.46 ක වියදමකින් Proposed Continuously Operating Reference Station Network (CORS) පාලන පද්ධති 06 ක් පමණක් පිහිටුවා තිබුණි.

මෙම සම්පූර්ණ ව්‍යාපෘතියේ වටිනාකම රු. මිලියන 200කට අධික වුවද මේ සඳහා ශක්‍යතා අධ්‍යයනයක් කිරීමට කටයුතු කර නොතිබුණි. මෙම ව්‍යාපෘතියට අදාල ප්‍රසම්පාදන කටයුතු මනා ලෙස සැලසුම් කර නොතිබීම නිසා එය ස්ථාපිත කිරීම වසර දෙකකින් ප්‍රමාද වී තිබුණි. මේ සඳහා මිළ ගණන් කැඳවීමේදී ජාතික තරඟකාරී ලංසු ක්‍රමය පසුව ද්විත්ව කවර ක්‍රමය ලෙස වෙනස්කර තිබුණු අතර, පිරිවිතර වල වෙනස්කම්ද සිදුකර තිබුණද ඒවා සියළු ලංසුකරුවන්ට විධිමත්ව දැනුම් දී නොතිබුණි. තවද ලංසු ඇගයීමට ලක් කිරීමේ දී හේතු රහිතව ඇතැම් ලංසු ප්‍රතික්ෂේප කර තිබුණු අතර ගිවිසුමෙහි ප්‍රමාද දඩ සම්බන්ධව ප්‍රතිපාදන ඇතුලත් නොකිරීම නිසා කොන්ත්‍රාත්තුව ඉටු කිරීම ප්‍රමාද කර ඇති මාස 10 ක කාලය සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීමට නොහැකි වී තිබුණි.

**(ඊ) අනෙකුත් නිරීක්ෂණ**

----------------------

(i) සමාලෝචිත වර්ෂයේ දී රු.මිලියන 3.39 ක වියදමින් වාහන 07 ක් අලුත්වැඩියා කිරීමට කටයුතු කර තිබුණි. මේ සඳහා මිළ ගණන් ලබා ගැනීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්වලට පටහැනිව කටයුතු කර තිබූ අතර මින් වාහන 03 ක් ආපසු භාර දීමට මාස 05 ක් ප්‍රමාද කර තිබුණි. අලුත්වැඩියා සඳහා යොමුකර තිබූ මෙම වාහන වල අලුත්වැඩියා වියදම් සුදුසුකම්ලත් නිළධාරියකු විසින් නිර්දේශ කර නොතිබුණි.

(ii) ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ විවිධ සැපයුම් හා සේවා සඳහා රු.මිලියන 1.62 ක් වැයකර තිබුණු අතර ලංසු ලබා ගැනීම, විවෘත කිරීම හා ඇගයීම ස්වාධීනව හා අපක්ෂපාතීව සිදුකර නොතිබුණි.

(iii) එමෙන්ම ත්‍රිකුණාමලය දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලය සඳහා රු.469,597 ක කාර්යාල ගෘහ භාණ්ඩ මිලදී ගැනීමේ දී පිරිවිතර සකස්කර ලංසුකරුවන්ට

ඉදිරිපත්කර නොතිබුණු නිසා විශාල මිළ පරතරයක් සහිතව මිළ ගණන් ඉදිරිපත් වී තිබුණි.

(iv) ඌව පළාත, බදුල්ල දිස්ත්‍රික්කය, නුවරඑළිය දිස්ත්‍රික්කය මිනින්දෝරු කාර්යාල හා මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනය යන කාර්යාලවල ප්‍රසම්පාදනයන් සඳහා රු.මිලියන 3.75 ක් වැයකර තිබුණි. මේ සඳහා තරගකාරී මිල කැඳවුම් ක්‍රමයක් අනුගමනය නොකර ලංසුකරුවන් තෝරාගෙන තිබුණු අතර, ලංසු විවෘත කිරීමේ දී හා ඇගයීමේ දී ප්‍රමාණවත් පරිපාටි අනුගමනය කර නොතිබුණි. මෙයට ගෙවීම් කිරීමේ දී රැඳවුම් මුදල් තබාගෙන නොතිබුණු අතර, වේයන් මර්ධනය කිරීමේ ප්‍රතිකර්මය සඳහා රු.300,360 ක් ගෙවා තිබූ නමුත් ඒ සඳහා වගකීම් සහතිකයක් ඉදිරිපත් කර නොතිබුණි.

**3.8.2 අධිකාරී බලය නොමැති වූ ගනුදෙනු**

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේදී බිම්සවිය වැඩසටහනේ දිරිදීමනා සඳහා පිළිවෙලින් රු.12,490,598 ක් හා රු.52,301,234 ක් වශයෙන් එකතුව රු.64,791,832 ක් ආයතන අධ්‍යක්ෂකගේ අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.

**3.9 අනාර්ථික ගනුදෙනු**

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගෙන රු.මිලියන 5.64 ක් වටිනා ලිතෝ කඩදාසි සහ තවත් කඩදාසි වර්ග දෙකක් 2015 වර්ෂයේදී මිලදීගෙන තිබුණි. විවිධ හානිවීම්වලට ලක්වෙමින් ඉන් සියයට 97 ක ප්‍රමාණයක් සමාලෝචිත වර්ෂය අවසානයේදී ඉතිරිවී තිබුණි.

(ආ) වර්ෂ 15 කට පමණ පෙර අවශ්‍යතාවයකින් තොරව මිළදී ගන්නා ලද වටිනාකම් හෙළිදරව් නොවූ ටයර් 17 ක් සහ ටියුබ් 64 ක් ගබඩාවේ පැවැති අතර, ඒවා භාවිතා කිරීමට සුදුසු තත්ත්වයක නොතිබුණි.

**3.10 කලමනාකරණ දූර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

**(අ) දිරි දීමනා ක්‍රමය**

දෙපාර්තමේන්තුවේ දිරි දීමනා ගෙවීමේදී මිනින්දෝරුවරයකු මාසිකව ඉටුකළ යුතු අවම වැඩ ප්‍රමාණය (Monthly Norms) තීරණය කර තිබුණි. එසේ වුවද මසකට දිරි

දීමනා ගෙවීමට අදාළ කරගත හැකි උපරිම කැබලි සංඛ්‍යාවක් හෝ මූලික වැටුපෙන් ප්‍රතිශතයක් ලෙස ගෙවිය හැකි සීමාවක් තීරණය කිරීමකින් තොරව 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා දිරි දීමනා හා අධීක්ෂණ ගාස්තු ගෙවා තිබුණි. 2016 වර්ෂයේදී පමණක් දිරි දීමනා හා අධීක්ෂණ ගාස්තු වශයෙන් රු.මිලියන 128.69 ක මුදලක් ගෙවා තිබුණි. ඇතැම් අවස්ථාවල දිරිදීමනා හා අධීක්ෂණ ගාස්තු ඔවුන්ගේ වාර්ෂික මූලික වැටුප ඉක්මවන ලෙස ද ගෙවීම් කර තිබුණි.

**(ආ) ගබඩා පාලනය**

------------------

ගබඩා හතරක් සම්බන්ධයෙන් සිදුකල නියැදි විගණන පරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ගොඩනැගිලි ද්‍රව්‍ය ගබඩාවේ අක්‍රමවත් බව නිසා සියළු තොග අයිතම ගණනය කිරීමට නොහැකි වී තිබුණි.

(ii) භාණ්ඩ වර්ග 146 ක භාණ්ඩ අයිතම 4285 ක ඌනතාවයන් මෙන්ම භාණ්ඩ වර්ග 237 ක භාණ්ඩ අයිතම 17715 ක අතිරික්තතාවයන් පැවතුණි.

(iii) ප්‍රධාන ගබඩා දෙකකින් නිකුත් කළ භාණ්ඩ වර්ග 84 ක භාණ්ඩ අයිතම 9858 ක් මෙන්ම එක් ගබඩාවකට ලැබී තිබුණු භාණ්ඩ අයිතම 157 ක් තොග ලේඛනවලට ගෙන නොතිබුණි. ප්‍රධාන ගබඩා තුනක භාණ්ඩ වර්ග 173 ක භාණ්ඩ අයිතම 10311 ක් කල් ඉකුත් වූ හෝ නිකුත් නොවන භාණ්ඩ විය.

(iv) ගබඩා කිහිපයක පෙර වර්ෂයේ සහ ප්‍රවර්තන වර්ෂයේ ගබඩා සමීක්ෂණ සිදුකර නොතිබුණි. ඊට පෙර සිදුකර තිබූ ගබඩා සමීක්ෂණ වලින්ද ඌනතාවයන් සහ අතිරික්තතාවයන් හඳුනාගෙන නොතිබුණි. තවද අධික වටිනාකමකින් යුත් මැනුම් උපකරණ වර්ග 493 ක් පවතින උපකරණ ගබඩාවේ කෞතුක වටිනාකමක් ඇති ඉතා පැරණි මැනුම් උපකරණ ද වන අතර මෙම උපකරණ වලින් භාණ්ඩ අයිතම 278 ක ඌනතාවයක් නිරීක්ෂණය විය. මෙම ගබඩාවේ රඳවා ඇති උපකරණ ක්‍රමානුකූලව පෙලගස්වා නොතිබුණු අතර පිරිසිදුතාවයද පහළ මට්ටමක පැවතුණි.

(v) සුබසාධක ගබඩාවේ භාණ්ඩ අයිතම 139 ක් මීට වර්ෂ කිහිපයකට පෙර ලැබී තිබුණද ඒවා ගබඩා ලෙජරවලට ඇතුලත් කර නොතිබුණි.

(vi) භාණ්ඩ වර්ග 690 ක් පමණ ගබඩා කර ඇති ගොඩනැගිලි ගබඩාවේ ඉඩකඩ ප්‍රමාණවත් නොවන බැවින් ඇතැම් තොග අයිතම විනාශ වී ගොස් පැවතුණි.

(vii) ගබඩා තුනක ගබඩා භාරකරුවකු ලෙස කටයුතු කල නිළධාරියකු වසර 20 ක සිට ගබඩා භාරකරු ලෙස යොදවාගෙන තිබුණි. එම නිළධාරියා

අනුමැතියකින් තොරව 2016 හා 2017 වර්ෂවල නිවාඩු 53 ක් ලබාගෙන තිබුණි. 2016 වර්ෂයේ වැටුප් රහිත නිවාඩු ඇතුළු මුළු නිවාඩු 83 ½ ක් ලබාගෙන තිබුණි. මෙසේ නිවාඩු ගැනීම සම්බන්ධ අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. ගබඩා පාලනයෙන් නිරීක්ෂණය වූ ඉහත දුර්වලතාවයන්ට මෙම තත්ත්වය සෘජුවම බලපා තිබුණි.

**(ඇ) අනෙකුත් නිරීක්ෂණ**

(i) කටුමාන සංචාරක නිවාසයේ ගරාජය වර්ෂ 4 කට ආසන්න කාලයක සිට උලුඅහු, ජනේල හා අබිලි ද්‍රව්‍ය ගොඩගසා තිබීම නිසා පරිහරණය කළ නොහැකි තත්ත්වයට පත් වී තිබුණි. දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ භාණ්ඩ අයිතම 2646 ක් අපහරණය කර රජයට අදායමක් ලබා ගැනීමට ද කටයුතු කර නොතිබුණි.

(ii) දියතලාව මැනුම් හා සිතියම්ගත කිරීමේ ආයතනයේ පුස්තකාලයේ අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලවලට වර්ෂ 09 කට අධික කාලයකට පෙර සිට බැහැරට ගෙන යාම සඳහා ලබා දී තිබූ රු.52,943 ක් වටිනා පොත් 83 ක් 2017 ජනවාරි 27 දින වනවිටත් ආපසු භාරදී නොතිබුණි.

(iii) කාර්යාලයකට සුදුසු නොවන ගොඩනැගිල්ලක බණ්ඩාරවෙල ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය පවත්වාගෙන යන අතර, මෙම ගොඩනැගිල්ල වර්ෂයකට රු.216,000 ක මුදලකට වර්ෂ දෙකක කාලයක් සඳහා කුලියට ගෙන තිබුණි.

## 3.11 මානව සම්පත් කළමනාකරණය

**(අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1139 | 995 | 144 |
| (ii) | තෘතියික මට්ටම | 83 | 60 | 23 |
| (iii) | ද්විතියික මට්ටම | 1345 | 967 | 378 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 4853 | 3883 | 970 |
| | **එකතුව** | **7420** | **5905** | **1515** |

(ආ) දෙපාර්තමේන්තුව වර්තමානයේ නවීන තාක්ෂණික උපකරණ, පරිගණක මෘදුකාංග හා GPS තාක්ෂණය භාවිතා කරමින් මැනුම් කටයුතු සිදු කලද 4154 ක් වූ මැනුම් ක්ෂේත්‍ර සහායක තනතුරු ප්‍රමාණය සමාලෝචනය කිරීමට කටයුතු කර නොතිබුණි. අ

(ඇ) මැනුම් ක්ෂේත්‍ර සහායකවරුන් 695 දෙනෙකු එම රාජකාරියට පරිබාහිර වූ කණිෂ්ඨ මට්ටමේ වෙනත් කාර්යයන් ඉටු කිරීමට යොදවා තිබුණි.

(ඈ) 2013 වර්ෂයෙන් පසුව මැනුම් ක්ෂේත්‍ර සහායක තනතුර සඳහා කාන්තාවන් 123 දෙනෙකු බඳවාගෙන තිබුණද එම රාජකාරිය කාන්තාවන්ට ඉටු කිරීමේ අපහසුව මත කාර්යාල හා වෙනත් කටයුතු සඳහා අනුයුක්ත කර තිබුණි.